(c) www.sinhalalyrics.com

බුදු තාත්තෙ බොන්න එපා
බුදු තාත්තෙ බොන්න එපා

එතෙරක දහදුක් විඳ අම්මා කාසි සොයා දෙන්නේ
සුරා සැලේ ඒ සේසත දියකර ඔබ ගෙදරට එන්නේ
අකාරුණික ලොව අමතක කරනුව ඔබ ලෝදිය බොන්නේ
එවිට අපද ඒ අකාරුණික වූ ලොව වල්මත් වන්නේ

හාමත් වී අප නින්දට වන් විට අසලින් ඇලවෙන්නේ
වරදට තැවෙමින් අප තුරුලට ගෙන තනිවම වැලපෙන්නේ
අප පාගාගෙන සිටිනා සතුරන් සටනට කැඳවන්නේ
සිහියෙන් මිස අවසිහියෙන් කෙලෙසද සතුරන් වනසන්නේ

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය - එච්. එම්. ජයවර්ධන